

## Digital තාරුණ්‍යය
**ප්‍රනීත් කාරියවසම්**

Hello" මචං කොහොමද ?
සෑහෙන කාලෙකින්
දැක්කෙත් නැහැ online
facebook එකේවත්..

viber හිටියා නේද ?
මොකක්ද දැන් තියෙන phone එක ?
4G ද ? camera එක හොඳද ?
කොහොමද ඉතින් girl friend ?

අවුලක් නැහැ මචං
ඉන්නවා ඔහේ..
කාලෙකින් ආවේ නැහැ
facebook නම්..

ඒත් ඉන්නවා messenger
උඹත් දාගනින්...........
viber වැඩක් නැහැ..
whatsapp නම් හොඳයි
අවුලක් නැහැ වගේ..

අම්මලා එක්ක නම් chat
දාන්නේ skype
ඒත් ඉන්නේ invisible

නැත්නම් chat එකට
එල්ලෙනවා කෙල්ලත්
ඉවරයක් නැහැ පටන් ගත්තම..
මේ දැනුත් තියෙනවා
හතරක් missed calls...........

හෙමින් සැරේ මමත්
දෙන්නම් උඹට call එකක්
ඉවරයි call credit
දැනටමත්..........

## බුද්ධි ගලනය
**අතුල විජේවික්‍රම**

එකම කන්දක් ඇතුළෙ සාරයන් උර උරා
එකම උල්පතින් අපි එකට එලියට ගියා
කඳු මුදුන් නිම්නයන් මැදින් දිය ඇලි සදා
බසින විට අපේ දම තවත් සැරසී ගියා

පෙනෙන විට ඉදිරියේ වියළි  ඉරිතැළුණු බිම්
නොදැනුණා  නොවේ නුඹගේ වෙනස මුහුණතින්
ඉදිරියට යද්දි  මා ඒ දුඹුරු බිම මැදින්
හැරුණී නුඹ මුහුද දෙස තිබුණු පොඩි හිඩැසකින්

සිරි සිසිරි හඬින් මා වැළඳගත් විට ඔවුන්
හද ඉපිල ගිය සතුට දැනී නැහැ කිසිවකින්
ඉඳහිටලා වෙරළෙ හැපිලා ගියත් විරසකින්
ඒ සුවය නුඹට වැටහෙන්නේ නැහැ සත්තකින්

## ඇන්ටන් ජෝන්ස්ලාට උපහාර හිඟයි
**විමල් කැටිපෙආරච්චි**



රන්වන් බයිලා කියා සවන් සැනසෙන
මන්මත් කර රට * රස තාල මවමින
අන්දර විස්තර කළ ගීත රසයෙන
ඇන්ටන් ජෝන්ස් අපෙන් ගියා සමුගෙන

කන්දේ හැපුණු අහස් යන්තරේ
ගංවතුර නැගෙනහිරේ ගැලූව විස්තරේ
සංගීත ස්වර සමග යසට මුසු කරේ
ඇන්ටන් ජෝන්ස් නාමෙ දිලෙයි අම්බරේ

අන්තෝනි මුනිඳු සහ මතුගම සමන් කුමාර
කන්තෝරුවෙ වැඩ නොකරන වෙච්ච විකාර
පණ්ඩිතයෝ නොලිව්වාට ගීත විචාර
ඇන්ටන් ජෝන්ස් තමයි කිව්වෙ ගීත හමාර

ඇතුන් රහසෙ කුලප්පු වෙන නුවර පෙරහැර
සිතුම් කළඹවාලන සීගිරි ගිරි ශිඛර
ඉතින් ඇති කියා බයිලා පොළෙන් පියවර
තබන්න සුබ රාත්‍රියක් නුඹට සුමිතුර

කැටුව එද්දි විවිධ සිද්ධි ගීත ඇතුළට
නැටුව තමයි වේදිකාව පහළ ජෝලියට
පිටුව පිටුව පෙරළල මිස හරි පිළිවෙලට
පටුව පටුන ලියන්න බැහැ අතීතයකට

සංස්කෘතිය වෙනස් වෙන්න ආසයි බයයි
සංගීතෙ සාගරෙ මිස බෝට්ටුව නෙමෙයි
සංවාදෙ නැති දූපතෙ අපවාද හුඟයි
ඇන්ටන් ජෝන්ස්ලාට උපහාර හිඟයි

ප්‍රේමවතී මනම්පේරි හුස්ම ගන්නවා
දාමරික පොඩි විජේගේ පපුව ගැහෙනවා
යානයක කළු පෙට්ටිය රහස් කියනවා
ආයෙ නොඑන ගී හඬක කඳුළු උනනවා

boondi.lk



## සෝම සමිඳුන්
**එඩී දයාරත්න**

පින්බර සෝම හිමියන්
බැහැ දුටිමි මපුතු සමගින්
ඔහු ඉපිද දින හතළිස් දෙකකින්

මපුතු කෙස් රොදක් හෙමිහිට
කපා සෝම සමිඳුන්
දුන් සැටි මගේ දෑතට
ඔවදන් රැසක් සමගින
අමතක නොවේ කිසි දින

විසි එක් වසක් ගෙවී ඇත
තරුණයෙකි මපුතු දැන්
එනමුදු ඔබ නොමැත
සෝම හිමියනි ගරුතර

කිසිදා නොමැකෙන මතකය
ඔබ තබා ගිය අප සිත් තුළ
රිදවයි අපේ හදවත්
සෝම හිමියනි සැමදා



## උල්කාරාධනාව
**තිළිණ හිරිපිටිය**

උදා වනු මැන එකම එක් වරක්
අහස දිදුලවා කියා දෙන්නට
මනු සතුන් එකම කුලකයක විසූ බව
හැපෙමින් ගැටෙමින් ජීවන අරගලය තුල
දහස් ගණනක් වසර පෙරාතුව . . .

ගිණි සැර විහිදුවා ආලෝකමත් කර
දල්වාලනු මැන සිත් පහන්
ඉරා අඳුරු පට අනවබෝධයේ සිහින
අත්පත් කර ගැනුමට නොහැකි බැවි
බෙලි කපා දමා කරමින් සමූහ දූෂණ . . .

පුපුරවා පාෂාණ දස අත
බිය ගන්වා සකල ලෝ තලයම
හඬගා කියනු මැන කුරිරු පොදු මිනිසාට
සිදු වනම බව අවැඩක් මූලධර්ම වාදයෙන්
සොදුරු මිනිසුන් අධම කරවන . . .

සියවසකට එකක් උව ඇත
උවද රුදුරු භයදකර ලොවැසි දන වෙත
පහව යන්නට හිසේ ගොම මැටි
වඩිනු මැන එකම එක උල්කාවක්
අමනුස්සයන්ට සුමග පෙන්වන . . .

## ගිළිහෙන ස්මෘතිය, එනම් රික්තයක මතකය
**මාලතී කල්පනා ඇම්බ්‍රෝස්**

මතකයන් බිකෙෂන් බිඳ
ගිලිහෙන විට
කාලයට නමක් දිය යුතු නම්
ශෝකය යයි කියනු මැන

දෙඇස්වල අවසාන එළි පොද
නිවී නො නිවී සිඳී යන විට
ප්‍රේමයට පර්යාය පද අවැසි නැත,
ඉඳහිට වැළඳ ගනු මැන

බෙදා ගත් දිවියක
සදාකාලික මතකය
කිසිවකින් මකනු බැරි බව
නිදාගත් මා හෘදයට
නිරතුරුව සිහිපත් කර දුන මැන

රික්තයක් තුළ නිහඬ ගොළු බව
දරා ගනු බැරි දිනයෙක,
සමු ගැනුම් අවැසි නැත
කිසිත් නොකියා ඉවත යනු මැන

කළු කුහරයක් මැද
අරුත් ගිලිහුණු ස්මෘතිය
කිසිත් නොහැගෙන ශූන්‍ය දෑසක
ඇස් පියන් යට තබා යනු මැන

හිස්කමක් මිස කිසිත් නො පෙනෙන
අන්ධකාර ම හදක පතුළත
මිදී ඝන වී කියනු බැරි වූ
ආදරය නම් දෙයක් තිබුණොය,
එයම පමණක් රැගෙන යනු මැන.

*"ස්මෘතිය අහිමි වීම විසින් එදිනෙදා පුරුදු බොහෝ දේ අමතක කර දමයි. ඇතැම් විට මනස හිස්වෙයි* හුරුපුරුදු කිසිවක් සිහියට නගා ගනු බැරිවෙයි.*

boondi.lk